**කැලණිය විශ්වවිද්‍යාලය - 2017**

**----------------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැළණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු වුවද 2013 දෙසැම්බර් 31 දිනට පෙර මිලදීගෙන තිබුණු පිරිවැය රු.653,159,142 ක් වූ ඉඩම් සඳහා ප්‍රත්‍යාගණනයන් සිදුකර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.52,021,032 ක් වූ මෝටර් රථ 23 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පර්චස් 2.51 ක ඉඩමක් මිලදී ගැනීමට හා එහි මුද්දර ගාස්තු ලෙස පිළිවෙලින් රු.1,894,340 ක් හා රු.74,773 ක් වැයකර තිබුණු අතර එය ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව වාහන සියයට 20 බැගින් ක්ෂය කරන අතර වර්ෂ 05 ක් අවසානයේ වාහනයක් සම්පූර්ණයෙන්ම ක්ෂයකර අවසාන විය යුතු වුවත් 2011 හා 2012 වර්ෂවල අත්පත් කරගත් පිරිවැය රු.16,715,704 ක් වූ වාහන 03 ක් 2017 වර්ෂයේදීද රු.3,343,141 ක් ක්ෂයකර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 104(3) සහ (4) උපවගන්ති | විශ්වවිද්‍යාලය සතු වාහන 11 ක් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී අනතුරුවලට භාජනය වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 396 (ඈ) | 2014 නොවැම්බර් 17 දින සිට 2017 ජූනි 30 දින දක්වා කාලය තුළ අවලංගු කරන ලද රු.1,113,344 ක් වටිනා චෙක්පත් 254 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්මවූ රු.75,000 ක ටෙන්ඩර් තැන්පතු හා රු.4,674,889 ක ආරක්ෂිත තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1(vii) ඡේදය | | විධායක කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් තොරව නිලධාරීන් 04 දෙනෙකු මාස 03 සිට වර්ෂ එක දක්වා කාලයක් වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා ගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.365,899,881ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.495,212,649 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.129,312,768 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බාහිර විභාග ආදායම රු.169,094,386 කින් පහළයාම සහ කාර්යමණ්ඩල පිරිවැය රු.137,382,648 කින් ඉහළයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයන් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ දේපළ, පිරියත හා

උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.1,572,617,629 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.2,691,011,756 ක් දක්වා අඛණ්ඩවම වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

**(අ) සිසුන් ඇතුළත් කරගැනීම**

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ පීඨ 5 කට බඳවාගත හැකිව තිබුණු සිසුන් සංඛ්‍යාව 3,205 ක් වූ අතර සිසුන් 3,235 ක් බඳවාගෙන තිබුණි. වෛද්‍ය පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය, වාණිජ හා කළමනාකරණ පීඨය සහ කලා පීඨය සඳහා පිළිවෙලින් සිසුන් 12, 12, 45 හා 116 ක් අතිරික්තව බඳවාගෙන තිබුණු අතර කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව, විද්‍යාපීඨය හා කලා පීඨයේ විශේෂ ප්‍රවේශය සඳහා පිළිවෙලින් සිසුන් 36, 46 හා 73 ක් අඩුවෙන් බඳවාගෙන තිබුණි.

**(ආ) දේශන පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශිෂ්‍ය අත්සන් ලේඛනවල දිනය, විෂය ඒකකය, කථිකාචාර්යවරයාගේ නම, අත්සන හා දේශන පැවැත්වූ වේලාව, අධ්‍යයන වර්ෂය යනාදී කරුණු සඳහන් නොකළ අවස්ථා රැසක් නිරීක්ෂණය වූයෙන් කථිකාචාර්යවරුන් අධ්‍යයන කාලසටහන් අනුව නියමිත පරිදි දේශන පැය ගණන ආවරණය කර තිබුණේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ii) බාහිර කථිකාචාර්යවරුන් සඳහා අධ්‍යයන පීඨ කාර්යාල විසින් පවත්වාගෙන යන පැමිණීමේ ලේඛනවල සඳහන් දිනයන් සහ ශිෂ්‍ය අත්සන් ලේඛනවල සඳහන් දිනයන් අතර නොසැසඳීම් පැවති අවස්ථා 23 ක් දර්ශන අධ්‍යයන අංශයේ සිදුකළ නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

**(ඇ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය විසින් පසුගිය අධ්‍යයන වර්ෂ 04 ක් සඳහා සිසුන් 67,828 ක් ලියාපදිංචි කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂයේදී විද්‍යාවේදී උපාධිය සඳහා ලියාපදිංචි කර ගන්නා ලද සිසුන් 91 ක් 2018 අගෝස්තු 31 දින වනවිට වසර 07 කට ආසන්න කාලයක් ගතකර තිබුණද කිසිවකු උපාධිය සම්පූර්ණ කරගෙන නොතිබුණි.

(ii) 2014 සහ 2015 අධ්‍යයන වර්ෂයන්හිදී ශාස්ත්‍රවේදී, ව්‍යාපාර කළමනාකරණවේදී හා වාණිජවේදී පාඨමාලා 3 ක් සඳහා ලියාපදිංචි කර ගත් සිසුන් 16,079 ක් වෙනුවෙන් ප්‍රථම පරීක්ෂණය 2018 අගෝස්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.

(iii) ශාස්ත්‍රවේදී හා ව්‍යාපාර කළමනාකරණවේදී පාඨමාලාවලට අදාළ විභාග 03 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 03 සිට අවුරුදු 03 දක්වා කාලයක් ගතකර තිබුණු අතර මේ දක්වා ප්‍රතිඵල නිකුත්කර නොතිබුණු විෂයන් 11 කට අදාළව පිළිතුරු පත් පරීක්ෂා කිරීමට අංශ ප්‍රධානීන්ට භාරදී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණත් ආපසු භාරදී නොතිබුණු බව නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී සිදු කළ පුස්තකාල පොත් සමීක්ෂණයේදී හඳුනාගත් අස්ථානගත වූ පොත් 28,876 ක වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේ සිදුකළ සමීක්ෂණ වාර්තාවට අනුව මෙම සංඛ්‍යාව වෙනස්වන බව මා වෙත දන්වා තිබුණු අතර එම වාර්තාව 2018 අගෝස්තු 31 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂවල විශේෂ අරමුණු සඳහා පිහිටුවන ලද අරමුදල් ගිණුම් 11 ක පැවති රු.174,824,530 ක් එම අරමුදල් පිහිටුවීමට අදාළ කාර්යයන් සඳහා යොදා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට සහ වෛද්‍යපීඨ සංවර්ධන අරමුදලට පිළිවෙලින් රු.132,733,087 ක් හා රු.42,091,443 ක් ලෙස මාරුකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ ආරම්භකර තිබුණු අරමුදල් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.13,705,037 ක් වුවත් 2018 අගෝස්තු 28 දින වන විට එයින් දරන ලද වියදම රු.959,380 ක් පමණක් විය.

(ඇ) පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා විදේශගත වන කථිකාචාර්යවරුන්ට ඔවුන්ගේ නවාතැන් ගාස්තු හා වෙනත් වියදම් ඔවුන් විදේශගත වීමට පෙර විදේශ විනිමය මගින් ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී විදේශගත වී තිබුණු කථිකාචාර්යවරුන් 7 දෙනෙකු විදේශගත වීමට පෙර රු.1,754,713 ක් ශ්‍රී ලංකා මුදලින් ගෙවා තිබුණි.

(ඈ) සමාජීය විද්‍යාපීඨයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට 2017 නොවැම්බර් 07 දින සිට 10 දින දක්වා එක්සත් රාජධානියේ පැවති සමුළුවකට පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා සහභාගී වීමට ලියාපදිංචි ගාස්තු, අනියම් දීමනා, ආහාර සහ නවාතැන් ගාස්තු ලෙස එ.ජ.ඩොලර් 5,442 ක් ගෙවා තිබුණි. නවාතැන් ගාස්තු සඳහා හෝටලයෙන් ලබාගත් මිල ගණන් අනුව දින 07 ක් සඳහා වූ ගාස්තුව පවුම් 341 ක් වුවත් එය එක් දිනක් සඳහා වූ ගාස්තුවක් ලෙස සලකා ගෙවීම් කර තිබීම හේතුවෙන් එ.ජ.ඩොලර් 3,410 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සමාජීය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකට 2012 වර්ෂයේ සිට 2018 පෙබරවාරි 12 දින දක්වාම අධ්‍යයන කාලසටහන්වලින් දේශන පැය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. මෙම කථිකාචාර්යවරිය සේවයේ යෙදී සිටි බව සනාථ කරගැනීම සඳහා වූ එකම සාක්ෂිය වූයේ 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ නිබන්ධන 20 ක පරීක්ෂණ කටයුතු හා පිළිතුරු පත්‍ර 306 ක් පරීක්ෂා කිරීම පමණි. එහෙත් මෙම කාලපරිච්ඡේදය තුළ ඇයට වැටුප් හා සියලු දීමනා ගෙවා තිබුණු අතර සක්‍රීය සේවා කාලයක් නොමැති වුවත් තවදුරටත් දේශන පැය ආවරණය කරන සේ සලකා 2015 සැප්තැම්බර් 08 දිනැති අංක 12/2015 දරන විශ්වවිද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම යාමේ වයසින් ඔබ්බට තවත් මාස 2 ½ ක කාලයක් සඳහා සේවා දිගුවක් ලබා දී තිබුණි. එසේම 2011 අප්‍රේල් 01 දින මෙම කථිකාචාර්යවරියට සහනදායී මෝටර් රථ බලපත්‍රයක්ද නිකුත්කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 වන පරිච්ඡේදයේ 33 ඡේදය ප්‍රකාරව විදේශ ශිෂ්‍යත්ව සඳහා යාමේදී, එළඹෙන ගිවිසුම් කඩ කළ කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 2018 අගෝස්තු 31 දිනට 21 දෙනෙකු වූ අතර ඔවුන්ගෙන් අයවිය යුතු මුදල රු.75,077,754 ක් විය.

එසේම බැඳුම්කර කඩ කළ ආචාර්යවරුන්ට වාරික වශයෙන් බැඳුම්කර මුදල ගෙවීමට ඉඩ සලසා දී තිබුණු අතර ඔවුන්ගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම ඉතා විශාල අගයක් ගෙන තිබුණත් වාරික අයවන කාලය නොසලකා මාසිකව රු.20,000, රු.30,000, හා රු.50,000 වැනි කුඩා වාරිකවලින් ගෙවීමට අවස්ථා ලබාදී තිබීම හේතුවෙන් බැඳුම්කර මුදල අයකර ගැනීමට දීර්ඝ කාලයක් ගත වී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1989 වර්ෂයේ දී Student Relief Fund නමින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කර තිබුණු අතර පොළියද සමග සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ ශේෂය රු.1,333,567 ක් විය. අරමුදල පිහිටුවීමේ අරමුණ, එයින් වියදම් දැරිය හැක්කේ කුමන හේතු සඳහාද ආදිය පිළිබඳව නිශ්චය කර නොතිබීම හේතුවෙන් වර්ෂ ගණනාවක් සිට මෙම අරමුදල ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය මගින් 1980 සිට 2010 දක්වා කාලය තුළදී ආරම්භ කර තිබුණු ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම් 16 ක සහ තෑගි අරමුදල් ගිණුම් 21 ක පිළිවෙලින් රු.4,097,398 ක සහ රු.4,249,691 ක ශේෂයන් පැවති අතර මෙම අරමුදල් ගිණුම් සඳහා ලැබූ පොළී ආදායම පිළිවෙලින් රු.4,910,648 ක් හා රු.3,171,581 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවස්ථා 5 කදී මෙම පොළී ආදායමින් රු.28,100 ක් පමණක් ශිෂ්‍යත්ව හා තෑගි ප්‍රදානය සඳහා උපයෝගී කරගෙන තිබුණු බැවින් මෙම අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට රු.29,736,235 ක ශේෂයක් පැවති අතර එයින් රු.18,032,876 ක් 2011 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සහ අනධ්‍යයන අංශයන් හි අනුමත සේවක සංඛ්‍යාව 1762 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 1385 ක් විය. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 398 ක් වූ අතර අතිරික්ත සේවක සංඛ්‍යාව 24 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ .

(i) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය 781 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 561 ක් වූයෙන් පුරප්පාඩු 220 ක් පැවතුණි. 2018 ජූලි 30 වන විට පුරප්පාඩුවලින් 37 ක් පමණක් සම්පූර්ණකර තිබූ අතර 91 දෙනෙකු බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පැවතුනද තවදුරටත් පුරප්පාඩු 92 ක් පැවතුණි.

(ii) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 152 ක් වූ අතර අතිරික්ත සේවක සංඛ්‍යාව 24 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයෙන් බාහිර තනතුරු දෙකක් සඳහා තිදෙනෙකු බඳවාගෙන තිබුණු අතර සෞඛ්‍ය සේවා කම්කරු අනුමත තනතුරු සංඛ්‍යාව 10 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 25 ක් වූයෙන් අතිරික්ත සංඛ්‍යාව 15 ක් වී තිබුණි. 2018 ජූලි 30 වනවිට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 34 ක් සඳහා බඳවාගෙන තිබූ අතර තව 14 ක් සැප්තැම්බර් මස වනවිට බඳවා ගැනීමට කටයුතු කරමින් පැවතුණද තවදුරටත් පුරප්පාඩු 101 ක් පැවතුණි.

## 4.6 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාගම වෛද්‍ය පීඨයට අනුයුක්ත බස්රථයක් 2016 මැයි 26 දිනෙන් පසු ධාවනය කරවා නොතිබුණු අතර මෙම වාහනය අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් බස් රථයක ඉදිරිපස හා පසුපස වීදුරු සවිකිරීම සඳහා මිල ගණන් කැඳවීමෙන් තොරව 2017 ජූලි 09 වෙනි දින පෞද්ගලික ගරාජයකට යොමුකර තිබූ අතර වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද එහි අළුත්වැඩියා නිම කර ආපසු භාරදී නොතිබුණි. දිගු කාලයක් එම බස් රථය ගරාජයෙන් පිටත ගාල්කර තිබීම හේතුවෙන් දිරාපත්වෙමින් පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කැලණිය විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එහෙත් විශ්වවිද්‍යාලය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කසල කළමනාකරණය, ජල කළමනාකරණය, බල ශක්ති කළමනාකරණය, වාසස්ථාන කළමනාකරණය හා පුහුණු පාඨමාලා වැඩසටහන් යනුවෙන් ව්‍යාපෘති 05 ක් මගින් තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගැනීමට විවිධ වැඩසටහන් හා ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇති බව උපකුලපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 09 දින එනම් දින 69 ක් ප්‍රමාද වීමෙන් පසුවය.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

### 6.2.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ කාර්යාල දෙකක තිරරෙදි සැපයීම වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.1,610,000 ක් ගෙවා තිබුණත් මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.1(ආ) අනුව ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ආ) මෙම ප්‍රසම්පාදන කාර්යයන් සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, අදාළ අනුමැතිය ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා යොමු කිරීම යනාදිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී කළයුතු කාර්යයන් වුවද මෙම ක්‍රියාපටිපාටියෙන් බැහැරව, සැපයුම්කරු තෝරා ගැනීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය හා පාලක සභා අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඇ) ඉහත ප්‍රසම්පාදනය සඳහා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීම් සිදුකරන බවට සඳහන්ව තිබුණද මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමූ සැපයුම්කරු විශ්වවිද්‍යාලයේ ඉහත කී කාර්යය සම්බන්ධයෙන් ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවුණු බව නිරීක්ෂණය විය.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------

කොන්ත්‍රාත් වටිනාකම රු.157,593,998 ක් වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා වූ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබුණු අතර එහි ඉදිකිරීම් 2016 සැප්තැම්බර් 01 දින ආරම්භ කර තිබුණි. 2018 අගෝස්තු 30 දිනට එය නිම කළ යුතු වුවද 2018 ජූනි 30 දින වනවිට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 48 ක් හා භෞතික ප්‍රගතිය සියයට 40 ක් පමණක් විය.

## 7. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත නොකිරීම හා අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම පොත්වලින් ඉවත් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන |

| | | |
|---|---|---|
| | | නොකිරීම. |
| (ආ) | පර්යේෂණ කටයුතු- | පර්යේෂණ සඳහා වෙන්කරන මුදල් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඇ) | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය | විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම. |
| (ඈ) | දේශන පැවැත්වීම | ශිෂ්‍ය අත්සන් ලේඛන නියමිත පරිදි නඩත්තු නොකිරීම. |
| (ඉ) | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම | කාර්යමණ්ඩල පුරප්පාඩු අප්‍රමාදව පිරවීමට කටයුතු නොකිරීම. |